


කෞමදි ජයශානි රත්නායක

# පාන්දරින් ආ අමුත්තා

## කෞමදි ජයශානි රත්නායක

**(කතෘ)**

**ISBN: 1727**

**මහමායා බාලිකා විද්‍යාලය**
**මහනුවර**

**3 – C**

**07.02.2025**

# පිදුම

මට හැමදාම ආදරය කරන මගෙ අම්මටත් අප්පච්චීටත්,
මගේ ඉස්කෝලේ පාන්තිබාර ගුරුමැණියන්ට සහ අප
පාසලේ ප්‍රධානාචාර්ය ගුරු මැණියන් ඇතුළු සියලුම ගුරු
මැණිවරුන්ට සහ ගුරු පියවරුන්ටත්, මගේ පන්තියේ
සියලුම යහලුවන්ටත්, මගේ පෙරපාසලේ  ප්‍රධානාචාර්ය
ගුරු මැණියන් අතුලු සියලූම ගුරුමැණියන්ටත්, මගේ
පෙරපාසලේ සියලූම යහලුවන්ටත් මෙම පාන්දරින් ආ
අමුත්තා

කතාව බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


# පාන්දරින් ආ අමුත්තා

ඔන්න එදා හොඳටම වැස්ස දවසක්. ඉතින් එදා අප්පච්චි පාන්දරින් කොළඹ යන්න අවදිවෙලා.

ඉතින් අප්පච්චිට හිතුනා වහින නිසා දොර ඇරලා බලන්න. අනේ, අප්පච්චි දොර අරිද්දිම අපේ ගෙදරට අමුත්තෙක් ඇවිල්ලා.

කව්ද දන්නවද පාන්දරම ආ අමුත්තා අපේ ගෙදරට?


අනේ ඒ වෙන කවුරුවත් නෙමෙයි. එයා තමයි ලස්සන ඉබි පැංචෙක්.



අනේ ඊට පස්සේ අප්පච්චි, අම්මටයි මටයි කතා කරලා

එයාව  පෙන්නුවා. එයා හරිම ලස්සනයි සහ හරිම
අහිංසකයි.

සද්දයක් ඇහුනොත් ඉක්මනට කටුව ඇතුලට
රිංගාගන්නවා.



අපේ ගෙදරට එහා පැත්තේ ඇලෙන්, වැස්සේ හෙමිහිට හෙමිහිට  අපේ ගෙදරට ඇවිල්ලා.

ඉතිං අප්පච්චි ඒවෙලාවෙම එයාව හෙමිහිට මල්ලකට දාලා ආයෙමත් ඇල පැත්තට ගිහින් දැම්මා.

අනේ, ඒත් ඉතිං මට නම් හිතුනා එයාව හැමදාමත් මගේ ළඟින්ම තියා ගන්න.

ඒත්, අම්මයි අප්පච්චියි කියාදුන්නා,  අහිංසක සත්තු හිර කරගෙන තියාගැනීම හොඳ වැඩක් නෙමෙයි කියලා.

එයාලටත් අපිට වගේම  නිදහසේ ජීවත්වීමට දෙන්න ඕන කියලා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්